

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව

කාර්යසාධන වාර්තාව - 2023

දුම්රිය මූලස්ථානය
කොළඹ 10

පටුන

පිටු අංකය

01 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැදින්වීම 01

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර 02

1.3 අරමුණු, ප්‍රධාන කාර්යයන් 03

1.4 සංවිධාන සටහන 04

1.5 ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන උප දෙපාර්තමේන්තු, අංශ හා ඒකකහා මාර්ග ජාලය 06

1.6 ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව යටතේ පවතින ආයතන / අරමුදල් 07

1.7 විදේශාධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු 07

02 පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම 08
විශේෂ ජයග්‍රහණ, අභියෝග හා ඉදිරි දැක්ම

03 පරිච්ඡේදය - වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය 18

3.2 මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය 20

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය 21

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන 22

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය 23

3.6 වෙන්කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය 23

3.7 මු. රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු වල නියෝජිතයෙක් ලෙස මෙම දෙපාර්තමේන්තුවට / දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට / පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන 23

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය 24

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව 34

04 පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශකය

4.1 ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව) 24

05 පරිච්ඡේදය- තිරසාර සංවර්ධන අරමුණු (SDG) පසුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාල තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න 25

5.2 තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න 26

06 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය 27

6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපා ඇති ආකාරය 27

6. 3 මානව සම්පත් සංවර්ධනය 28

07 පරිච්ඡේදය -අනුකූලතා වාර්තාව 31

01 පරිච්ඡේදය

1.1 හැඳින්වීම

ශ්‍රී ලාංකීය ප්‍රවාහන පද්ධතියේ පුරෝගාමී මෙහෙවරක් සිදු කරන ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව 1864 දෙසැම්බර් 26 වන දින තම ප්‍රථම මංගල ගමන සනිටුවහන් කිරීමෙන් ආරම්භ කරන ලද තම මෙහෙවර වසර 159 ක් පුරාවට සිදු කරමින් පවතී.

ප්‍රධාන ප්‍රවාහන සැපයුම් මාධ්‍යයක් ලෙස ශ්‍රී ලංකා දුම්රිය සේවය 2023 වර්ෂයේදී ආර්ථික වර්ධනය සඳහා දායකත්වයක් දක්වමින් තම සේවා කටයුතු අඛණ්ඩව පවත්වා ගෙන යන ලදි. 2023 වර්ෂයේදී මගී හා භාණ්ඩ ප්‍රවාහන කටයුතු වල අඛණ්ඩ මෙහෙවරක යෙදෙමින් පරිසර හිතකාමී හා පිරිමැසුම්දායී ප්‍රවාහන මාධ්‍යයක් ලෙස තම සේවා කටයුතු කාර්යක්ෂමව ලබා දීමට කටයුතු කරන ලදී.

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව රජයේ ප්‍රධාන දෙපාර්තමේන්තුවක් ලෙස ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ. මෙම දෙපාර්තමේන්තුව දුම්රිය ආඥා පනතේ ඇති විධිවිධානයන්ට යටත්ව කටයුතු ක්‍රියාත්මක කරනු ලබන අතර දුම්රිය සාමාන්‍යාධිකාරී දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා ලෙස කටයුතු කරයි. ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ ශාඛා හා ඒකක 14 ක් යටතේ පරිපාලන කටයුතු විමධ්‍යගතවී තිබෙන අතර අදාල උප දෙපාර්තමේන්තුවේ, ශාඛාවේ හෝ ඒකකයේ ප්‍රධානියා විසින් ඒ,ඒ අංශයට පැවරී ඇති කාර්යයන් ක්‍රියාත්මක කරනු ලබයි.

රටේ සමස්ත දිස්ත්‍රික්ක 25 න් දිස්ත්‍රික්ක 21 ක් ආවරණය වන පරිදි මාර්ග කිලෝමීටර් 1,478.52 දුරකින් යුතුව සමස්ත දුම්රිය ස්ථාන 418 ක් මඟින් දුම්රිය ප්‍රවාහන කටයුතු සිදු කරනු ලබයි. තම මුඛ්‍ය පරමාර්ථය වූ මගී හා භාණ්ඩ ප්‍රවාහනය සඳහා ආරක්ෂිත, විශ්වාසදායි, නියමිත වේලාවට ධාවනයවන සකසුරුවම් හා කාර්යක්ෂම දුම්රිය ප්‍රවාහන සේවාවක් සැපයීම හා පරිසර හිතකාමී හා පිරිමැසුම්දායී ප්‍රවාහන මාධ්‍යයක් ලෙස තම සේවා කටයුතු වඩා කාර්යක්ෂම ලෙස ඉටු කිරීමට සමස්ථ කාර්යමණ්ඩලය ඉහළ කැපවීමකින් කටයුතු කරනු ලබයි. 2023 වර්ෂයේදී ද ආර්ථික අර්බුදය හා බැඳුනු විවිධ බාධක හා අභියෝගයන් මධ්‍යයේ වුවද තම සේවා කටයුතු අඛණ්ඩව පවත්වා ගෙන යාමට දුම්රිය දෙපාර්තුමේන්තුවට හැකි විය.

මගී ජනතාව සඳහා කාර්යක්ෂම හා සුවපහසු දුම්රිය සේවාවක් ලබාදීම සඳහා ක්‍රියාමාර්ග රාශියක් ගනු ලැබීය. ඒ අනුව, චීනයෙන් හා ඉන්දියාවෙන් ආනයනය කරන ලද නවීන දුම්රියන් දුර ගමන් සේවා සඳහා හා සංචාරක සේවා සඳහා යෙදවීම, නව දුම්රිය සේවාවන් හඳුන්වාදීම ආදිය මගින් මගී ජනතාවගේ ප්‍රවාහන අවශ්‍යතාවය සපුරා ගැනීමට ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව යුහුසුළුව කටයුතු කරන ලදී.

දැක්ම

ශ්‍රී ලංකාවේ මගී හා භාණ්ඩ ප්‍රවාහනයේ
වඩාත් විශ්වසනීය
ප්‍රවාහන සැපයුම්කරු බවට පත්වීම

මෙහෙවර

මගී හා භාණ්ඩ ප්‍රවාහනය සඳහා
ආරක්ෂිත, විශ්වාසදායි
හා කාර්යක්ෂම
දුම්රිය ප්‍රවාහන සේවාවක් සැපයීම


අරමුණු

- දුම්රිය මගී හා භාණ්ඩ ප්‍රවාහන අංශයන්හි දායකත්වය වර්ධනය කිරීම
- දුම්රිය මෙහෙයුම් වල ආරක්ෂාව තහවුරු කිරීම
- මගී දුම්රිය සේවාවන්හි ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම
- දුම්රිය කාර්ය මණ්ඩලයේ හා සම්පත් භාවිතයේ ඵලදායීබව වර්ධනය කිරීම
- දුම්රිය ආදායම වැඩි කිරීම
- මානව සම්පත සංවර්ධනය කිරීම
- දුම්රිය යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම

1.3 ප්‍රධාන කාර්යයන්

- මගී ප්‍රවාහන කටයුතු ක්‍රියාත්මක කිරීම
- භාණ්ඩ ප්‍රවාහනය සිදු කිරීම
- විශේෂ මගී දුම්රිය සේවා ක්‍රියාත්මක කිරීම

1.4 සංවිධාන ව්‍යුහය


GENARAL MANAGER RAILWAY
A.G.M. (A)
A.G.M. (O)
A.G.M. (I)
A.G.M. (T)
A.G.M. (M)
C.F.O
DGM
DGM(T)
DGM C
DGMT
DGMP
SRP
D/A
CE(S)
CE(W)
CEM
CEMO
CIA
CA
DIT
DES
DEBU
DEBR
DEW
DEME
DEM
DEMO
DCET
SC
ST
SS
SEP
SES
SFNW
SFNF
SFMI
D P
SP
DSRP
DEC P&P
SE P&P
AC
AST
MAR
EP
ES
S
EW
CM
EE
EM
ATE
ATM
ET
ADA
LGO
ADE
E P&P

Level 1 **G. M. R** –General Manager railway

Level 2 **AGM(A)** – Addl. General Manager(Admin), **AGM(M)** - Addl. General Manager(Mechanical), **A. G. M. (M)** - Addl. General Manager(Infrastructure), **A. G. M. (O**)- Addl. General Manager(Operation), **C. F. O** – Chief Finance officer

Level 3 **DGM**-Deputy General Manager (Admin), **DGM(T**) - Deputy General Manager (Training & HR), **CEM** – Chief Engineer (Motive Power), **CME**- Chief Mechanical Engineer, **CE(W)** Chief Engineer (Way & works), **CSTE-** Chief Engineer (Signal & Telecommunication), , **DGM(C**) - Deputy General Manager (Commercial), **DGMT**- Deputy General Manager (Transport), **CIA**- Chief Internal Auditor, **CA**- Chief Accountant, SRP- Superintendent(RP), **DGMP** - Deputy General Manager (Procurement), **D P** – Director (Planning)

Level 4 **D(A)**-Director (Admin), **DCET** - Deputy Chief Engineer (Training & HRB), **DEMO** - Deputy Chief Engineer (Motive Power), **DEM**- Deputy Chief Engineer (Mechanical), **DEME** - Deputy Chief Engineer (Electrical), **DEW** - Deputy Chief Engineer (Way & Works), **DEBR** - Deputy Chief Engineer (Way & Bridges), **DEBU** - Deputy Chief Engineer (Property Development &Building), **DES** - Deputy Chief Engineer (Signal & Telecommunication), **SC** – Superintendent Commercial, **ST** – Superintendent Transportation

Level 5 **SEM** – SuperintendentEngineer(Motive Power), **SEME**- SuperintendentEngineer(Mechanical), **SEW** – SuperintendentEngineer (Way & works), **SS** – Surveyor Superintendent, **SES** – SuperintendentEngineer (Signal & Telecommunication), **SEP** -SuperintendentEngineer (Planning Project), **DSSM** – DeputySuperintendent (Sales & Marketing), **DIT** - DeputyDirector (Information Technology), **DSRP** - DeputySuperintendent (R. P), **SP** – Superintendent (Procurement)

Level 6 **ADA** – Assistant Director (Admin) / Deputy Director (Admin), **LGO** – Legal Officer, **ET** – Engineer (Training & HRB), **EM** – Engineer (Motive Power), **ATM** – Asst. Transportation Superintendent (Mechanical), **ATE** - Asst. Transportation Superintendent (Energy Conservation), **EM** – Engineer (Mechanical), **EE**– Engineer (Electrical), **CM** – Chemist & Methodologist, **EW** – Engineer (Way & Works), **S** – Surveyor, **ES** – Engineer (Signaling & Telecommunication), **EP** – Engineer (Planning & Project), **AC** – Asst. Director / Deputy Director (Cost), **AST**– Asst. Superintendent (Transportation / Commercial), **AC** – Accountant, **ADI** – Asst. Director (Information Technology), **ASRP**-Asst. Superintendent (R. P), **ASP**– Asst. Superintendent (Procurement), **ADP** – Asst. Director (Planning)

1.5 ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ උප දෙපාර්තමේන්තු, අංශ හා ඒකක හා මාර්ග ජාලය

වගු අංක 01 **උප දෙපාර්තමේන්තු, අංශ හා ඒකක**

#	උප දෙපාර්තමේන්තු/ඒකක	දෙපාර්තමේන්තුව / උප දෙපාර්තමේන්තු/ඒකක ප්‍රධානීන්
01	දුම්රිය සාමාන්‍යාධිකාරි කාර්යාලය	දුම්රිය සාමාන්‍යාධිකාරී
02	ප්‍රධාන යාන්ත්‍රික ඉංජිනේරු උප දෙපාර්තමේන්තුව	ප්‍රධාන ඉංජිනේරු (යාන්ත්‍රික)
03	ප්‍රධාන ඉංජිනේරු (මාර්ග/කර්මාන්ත) උප දෙපාර්තමේන්තුව	ප්‍රධාන ඉංජිනේරු (මාර්ග/කර්මාන්ත)
04	ප්‍රධාන ඉංජිනේරු (ධාවන බල)උප දෙපාර්තමේන්තුව	ප්‍රධාන ඉංජිනේරු(ධාවන බල)
05	ප්‍රධාන ඉංජිනේරු (සංඥා සහ විදුලි සංදේශ) උප දෙපාර්තමේන්තුව	ප්‍රධාන ඉංජිනේරු (සංඥා හා විදුලි සංදේශ)
06	ගණකාධිකාරි උප දෙපාර්තමේන්තුව	ප්‍රධාන මූල්‍ය නිලධාරි
07	වාණිජ උප දෙපාර්තමේන්තුව	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (වාණිජ)
08	දුම්රිය ගබඩා උප දෙපාර්තමේන්තුව	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි(ප්‍රසම්පාදන)
09	ගමනාගමන උප දෙපාර්තමේන්තුව	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි(ගමනාගමන)
10	ශ්‍රී ලංකා දුම්රිය ආරක්ෂක සේවය	ආරක්ෂක අධිකාරි
11	ශ්‍රී ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනය	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (පුහුණු හා මානව සම්පත්)
12	ප්‍රධාන පිරිවැය නිලධාරි කාර්යාලය	ප්‍රධාන පිරිවැය නිලධාරි
13	සැලසුම් ඒකකය	අධ්‍යක්ෂ (සැලසුම්)
14	දත්ත සැකසුම් ඒකකය	කළමනාකරු දත්ත සැකසුම්

වගු අංක 02

දුම්රිය මාර්ග ජාලය

මාර්ගය	දුර කි.මී.	දුම්රිය ස්ථාන සංඛ්‍යාව	උප දුම්රිය ස්ථාන සංඛ්‍යාව	දුම්රිය හෝල්ට්
මුහුදුබඩ මාර්ගය(කොළඹ කොටුව සිට බෙලිඅත්ත දක්වා)	183.28	41	34	0
ප්‍රධාන මාර්ගය(කොළඹ කොටුව සිට බදුල්ල දක්වා)	292.38	46	33	21
මාතලේ මාර්ගය (පේරාදෙණියේ සිට මාතලේ දක්වා)	33.6	08	14	04
පුත්තලම් මාර්ගය (රාගම සිට පුත්තලම දක්වා)	119.57	18	25	0
පුත්තලම අරුවක්කාලු මාර්ගය	37.00	1		
කැලණිවැලි මාර්ගය (මරදාන සිට අවිස්සාවේල්ල දක්වා)	59.37	13	17	8
වරාය මාර්ගය	7.00	1	-	-
කොලොන්නාව මාර්ගය	3.18	1	-	-
උතුරු මාර්ගය (පොල්ගහවෙල සිට කන්කසන්තුරය දක්වා)	339.47	32	26	20
තලෙමන්නාරම් මාර්ගය (මැදවච්චියේ සිට තලෙයිමන්නාරම දක්වා)	106.05	08	04	0
මිහින්තලේ මාර්ගය	13.50	01	0	2
මඩකලපු මාර්ගය (මහව සිට මඩකලපුව දක්වා)	211.11	16	17	05
ත්‍රිකුණාමල මාර්ගය(ගල්ඔය හංදියේ සිට ත්‍රිකුණාමලය දක්වා)	70.23	05	03	01
Total	**1,475.74**	**192**	**173**	**61**

1.6 දෙපාර්තමේන්තුව යටතේ පවතින ආයතන / අරමුදල්

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව යටතේ වෙනත් ආයතන හෝ අරමුදල් නොමැත

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු

වගු අංක 03

#	ව්‍යාපෘතියේ නම	ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම (ඇ.ඩො. මි.)	වර්තමාන ප්‍රගතිය 2023.12.31 දිනට
	මහව සිට ඕමන්තේ දක්වා දුම්රිය මාර්ගය පුනරුත්ථාපන ව්‍යාපෘතිය	91.26	ක්‍රියාත්මක වෙමින් පවතී. සමස්ථ ව්‍යාපෘතියෙන් 62% සම්පූර්ණ කර ඇත.

02 පරිච්ඡේදය

ප්‍රගතිය හා ඉදිරි දැක්ම.....

සමස්ත ප්‍රගතිය

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තුමේන්තුව (SLR) ශ්‍රී ලංකාවේ ප්‍රධාන ප්‍රවාහන සේවා සපයන්නෙකු ලෙස 2023 වර්ෂයේදී ශ්‍රී ලංකා ආර්ථිකයට සිය උපරිම සහ අඛණ්ඩ දායකත්වය ලබා දෙන ලදී. විවිධ අභියෝග සහ අනපේක්ෂිත තත්ත්වයන් මධ්‍යයේ වුවද, 2023 වසරේ මගී සහ භාණ්ඩ ප්‍රවාහන කටයුතු වල නියැලුනි.

2023 වර්ෂයේදී ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තුමේන්තුවේ මුළු ආදායම් රුපියල් මිලියන 16,079 දක්වා රුපියල් මිලියන 5,003.37 කින් වැඩි විය. සමස්ත ආදායමට ඇතුළත් සියලුම ආදායම් ඛාණ්ඩ 2023 දී විශාල වර්ධනයක් පෙන්නුම් කරන ලදී. මගී ආදායම 2023 වසරේදි රුපියල් මිලියන 13,239.17 ක් වූ අතර එය පසුගිය වසර හා සසඳන විට මිලියන 4,064.26 ක වැඩිවීමකි. මෙලෙස මගී ආදායම වැඩිවීම සඳහා බලපාන ලද්දේ ගමන් කරන මගීන් සංඛ්‍යාව වැඩි වීමක් පෙන්නුම් කරන ලදී.

2023 වසරේදී මුළු වියදම රුපියල් මිලියන 38,983 ක් වූ අතර එය 2022 දී රුපියල් මිලියන 42,530 වාර්තා විය. මුළු වියදම තුල පුනරාවර්තන වියදම් සහ ප්‍රාග්ධන වියදම් ඇතුළත් වේ. 2023 දී මුළු පුනරාවර්තන වියදම් රුපියල් මිලියන 27,840 කි. 2022 දී එය රුපියල් මිලියන 23,512කි. ඉන්ධන වියදම් වැඩිවීම පුනරාවර්තන වියදම් ඉහළ යාමට ප්‍රධාන හේතුව විය. ප්‍රාග්ධන වියදම 2023 දී රු. මිලියන 11,143 ක් සහ 2022 දී රුපියල් මිලියන 19,018 ක් විය.ප්‍රාග්ධන වියදම් අඩුවීම සඳහා බලපානු ලැබුවේ සංවර්ධන ව්‍යාපෘති සීමා කිරීම හා විදේශ අරමුදල් ගෙවීම අඩු වීමයි.

මගී මැදිරි 200ක් පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතියේ දිගුවක් ලෙස තවත් මැදිරි 100ක් පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය 2023 වර්ෂයේදී අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී. මාර්ග ජාලයේ, සංඥා සහ විදුලි සංදේශ පද්ධතියේ සහ දුම්රිය ඇණියේ සියලුම නඩත්තු සහ වැඩිදියුණු කිරීම් වෙන් කරන ලද අයවැය ප්‍රතිපාදන තුළ අඛණ්ඩව සිදු කරන ලදී.

මගි හා භාණ්ඩ ප්‍රවාහන කටයුතු වල ගුණාත්මකභාවය තවදුරටත් වර්ධනය කිරීම සඳහා මහව සිට ඕමන්ත දක්වා දුම්රිය මාර්ගය පුනරුත්ථාපන කටයුතු ක්‍රියාත්මක කිරීම, එමෙන්ම තන්ත්‍රි සමාගම මගින් දුම්රිය මැදිරි 100 පුනරුත්ථාපනය කිරීම ආදී කටයුතු දුම්රිය සංවර්ධනය සඳහා 2023 වසර තුළ ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන ව්‍යාපෘති වේ.

තවද මුහුදුබඩ දුම්රිය මාර්ගයේ දකුණු පයාගල සිට අළුත්ගම දක්වා ද්විත්ව දුම්රිය මාර්ගයේ මූලික කටයුතු ආරම්භ කිරීම හා පුත්තලම දුම්රිය මාර්ගයේ මීගමුව හා කුරුණෑ අතර ද්විත්ව දුම්රිය මාර්ගයේ වැඩ කටයුතු ක්‍රියාත්මක කරන ලදී.

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව පවතින අභියෝග ජයගනිමින් තිරසාර සංවර්ධන සංකල්ප අනුව ගමන් කිරීම සඳහා සියලු උත්සාහයන් දරනු ලබයි. එම ඉලක්කයන් සපුරා ගැනීම සඳහා උපරිම කැපවීමෙන් යුතුව නිවැරදි දැක්මක් යටතේ දුම්රිය දෙපාර්තමේන්තුව කටයුතු කරනු ලබයි. විශේෂයෙන් ඉන්දිය ණය ආධාර යටතේ හා චීන ණය ආධාර යටතේ මෙරටට ආනයනය කරන ලද සුඛෝපභෝගී දුම්රියන් මගී ජනතාවගේ ගමන් පහසුව සඳහා යොදාගෙන තිබේ. එමෙන්ම සංචාරක ප්‍රජාවන්ද ඉලක්ක කර ගනිමින් විශේෂ දුම්රියන් යොදවා තිබීම සංචාරක කර්මාන්තයේ දියුණුවටද ධනාත්මක බලපෑමක් වනු ඇත. තවද මගී නොවන ආදායම් මාර්ග ප්‍රවර්ධනය සඳහා විශේෂ වැඩසටහන් කිහිපයක්ම සැලසුම් කරන ලදී.

2023 වර්ෂයේදී දුම්රිය මඟින් මගීන් මිලියන 109.15 ක් ගමන් කල අතර මගී කිලෝමීටර් මිලියන 7,043.98ක දුර ප්‍රමාණයක් ධාවනය කර ඇත. එමෙන්ම භාණ්ඩ ටොන් මිලියන 1.99 ක් ප්‍රවාහනය කරමින් හා භාණ්ඩ ටොන් කිලෝමීටර් මිලියන 159.46 ක් ධාවනය කරමින් ශ්‍රී ලංකා දුම්රිය සේවය සිය අඛණ්ඩ දායකත්වය ආර්ථිකය වෙත ලබා දී ඇත.

මූල්‍ය ප්‍රගතිය

2023 වසරේදී ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව උපයාගත් ආදායම් හා වියදම් පිළිබඳ තොරතුරු පහත වගුවෙන් දක්වා ඇත.

ආදායම 2022 - 2023

වගු අංක 04

#	ආදායම් කාණ්ඩය	ආදායම (රු. මි.) 2022	ආදායම (රු. මි.) 2023
01	මගී	9,174.91	13,239.17
02	පාර්සල් සහ තැපැල්	296.98	392.06
03	භාණ්ඩ හා පශු සම්පත්	915.66	1,761.63
04	වෙනත්	688.53	686.55
එකතුව		**11,076.10**	**16,079.47**

වියදම් කාණ්ඩ 2022 - 2023

වගු අංක 05

වියදම් කාණ්ඩය	2022(රු. මි)	2023(රු. මි)
පුනරාවර්ථන වියදම	23,512.62	27,840
ප්‍රාග්ධන වියදම	19,018.81	11,143
එකතුව	**42,531.43**	**38,983**

බස් ගාස්තු වලට සාපේක්ෂව දුම්රිය ගාස්තු අඩුවීම තුළ දුම්රියෙන් ගමන් කරනු ලබන මගීන් සංඛ්‍යාව වැඩිවීම හේතුවෙන් දුම්රිය ආදායමේ වර්ධනයක් 2022 සාපේක්ෂව 2023 වසර තුළ පෙන්නුම් කරන ලදී. 2022 වර්ෂයේ මුළු අදායම රු. මි.11,076.10 ක් වූ අතර එය 2023 වර්ෂය තුළ රු. මි. 16,079.47 ක් විය. ඒ අනුව මුළු ආදායමේ 45 % ක වැඩිවීමක් පෙන්නුම් කරයි.

2023 වර්ෂයේ මුළු වියදම රු. මි. 38,983 වූ අතර මේ තුළ රු. මිලියන 27,840ක් පුනරාවර්තන වියදම හා රු. මි. 11,143ක් වූ ප්‍රාග්ධන වියදම ඇතුළත් විය.

වාණිජ කටයුතු

ආදාල කාලපරිච්ඡේදය තුළ දුම්රිය ආදායම් ඉහළ නැංවීම සඳහා පහත සඳහන් වාණිජ කටයුතු ක්‍රියාත්මක කරන ලදි.

1. සංචාරක ආකර්ෂණය සහිත නාගරික දුම්රිය ස්ථාන හා පරිශ්‍ර සංවර්ධනය කර ව්‍යාපාර කටයුතු සිදු කිරීම හා දුම්රිය පරිශ්‍රයන්හි වහල වල සූර්ය පැනල සවි කිරීමට කැමැත්ත දක්වන පාර්ශවයන්ට ආරාධනා කිරීම සිදු කරන ලදී.

2. පෞද්ගලික පාර්ශවයන් සමග එක්ව ව්‍යාපෘති යෝජනා සකස්කර හිස් ඉඩම් භාවිතයට ගැනීම හා පවතින ගොඩනැගිලි සංවර්ධනය කිරීම සඳහා කටයුතු කිරීම.

3. දුම්රිය ස්ථානවල හා දුම්රිය පරිශ්‍රවල ව්‍යාපාර කටයුතු සිදු කරීම සඳහා කටයුතු ආරම්භ කිරීම.

4. දුම්රිය ස්ථාන බඩු ගබඩා, දුම්රිය ස්ථාන ස්ථාවර භෝජනාගාර, දුම්රිය පරිශ්‍ර වලට අදාල සුළු අළෙවි සැල් ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඔස්සේ ලබාදීම.

5. දුම්රියෙන් කෘෂි භෝග නිෂ්පාදන ප්‍රවාහනය සඳහා සැලසුම් සකස් කිරීම.

6. වනවාසල සිට අරුවක්කාරු දක්වා දුම්රියෙන් කසල ප්‍රවාහනය සඳහා අදාල ඉදිරි වැඩකටයුතු සැලසුම් කිරීම.

7. නව ATM යන්ත්‍ර 4 ක් වෙයන්ගොඩ , රාගම , මීරිගම , මරදාන යන දුම්රිය ස්ථාන වල ස්ථාපිත කිරීම.

8. ප්‍රීමා පිටි ප්‍රවාහන කටයුතු, තෙල් ප්‍රවාහනය කිරීම් හා සිමෙන්ති ප්‍රවාහන කටයුතු සිදු කිරීම.

යටිතල පහසුකම් සංවර්ධනය

සංවර්ධන සහ නඩත්තු සංවර්ධන කටයුතු අඛණ්ඩව කරන ලදි.

- දුම්රිය මාර්ගයන්හි නඩත්තු කටයුතු අඛණ්ඩව සිදුකිරීම.
- මහනුවර, පේරාදෙණිය සහ කඩුගන්නාව දුම්රිය මාර්ගය හා සම්බන්ධ කාර්යයන් අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම.
- පුත්තලම් මාර්ගයේ ද්විත්ව දුම්රිය මාර්ගයේ ඉදිකිරීම් කටයුතු කුරණ සිට මීගමුව දක්වා නිමකිරීම හා මීගමුව සිට කොච්චිකඩේ අතර ද්විත්ව දුම්රිය මාර්ග ඉදිකිරීම ආරම්භ කිරීම.
  නව දුම්රිය ස්ථාන ගොඩනැඟිලි ඉදිකිරීම, පාලම් නඩත්තු කිරීම සහ දුම්රිය ස්ථානයන්හි සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම අඛණ්ඩව සිදුකිරීම.
- අනුරාධපුරය හා වවුනියාව අතර පාලමක් ස්ථාපිත කිරීම.
- ගැටඹේ සරසවි උයන ද්විත්ව මාර්ගයේ කටයුතු ආරම්භ කිරීම.
- කොච්චිකඩේ, නාත්තන්ඩිය දුම්රිය ස්ථානයන්හි ගුවන්පාලම් ස්ථාපිත කිරීම
- මිහින්තලය දුම්රිය මාර්ගය ප්‍රමුඛතා ගත කිරීම.
- කන්ටෙනර් රථ ගැටීමෙන් වන අනතුරු වලක්වා ගැනීම සඳහා කැළණිය කළු පාලමේ උස තවදුරටත් වැඩි කිරීම.
- දකුණු පයාගල හා අලුත්ගම දක්වා ද්විත්ව දුම්රිය මාර්ගය ඉදි කිරීමේ මූලික සැලසුම් කටයුතු අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම.
- මහව සිට ඕමන්තේ දක්වා දුම්රිය මාර්ගය පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ අනුරාධපුරය සිට ඕමන්ත දක්වා කොටසේ පුනරුත්ථාපන කටයුතු අවසන් කිරීම හා අනුරාධපුර සිට මහව දක්වා කොටසේ පුනරුත්ථාපනය කිරීම සඳහා කටයුතු ආරම්භ කිරීම.

දුම්රිය ඇණිය

කාර්යක්ෂම මගී හා භාණ්ඩ ප්‍රවාහන සේවාවක් සැපයීම සඳහා ශ්‍රී ලංකා දුම්රිය සේවය සතු දුම්රිය ඇණිය සඳහා නඩත්තු හා අලුත්වැඩියා කටයුතු අඛණ්ඩව සිදු කරන ලදී.

එන්ජින්වල ප්‍රධාන අළුත්වැඩියාවන් 19 ක් හා සුළු අළුත්වැඩියාවන් 277 ක් සිදු කරන ලදී. මැදිරි වල ප්‍රධාන අළුත්වැඩියාවන් 67 ක් හා සුළු අළුත්වැඩියාවන් 93 ක් සිදු කරන ලදී. වැගන්වල ප්‍රධාන අළුත්වැඩියාවන් 63 ක් හා සුළු අළුත්වැඩියාවන් 487 ක් සිදු කරන ලදී. මගී මැදිරි පුනරුත්ථාපනය, බලවේග කට්ටල, S8 හා M7 වර්ගයේ එංජින් දෙකක පුනරුත්ථාපන කටයුතු සිදු වනු ලබන අතර ඉන් 70% වැඩ අවසන් වී ඇත. ගැල් 02 ක් අළුත්වැඩියාවන් සිදු කිරීම, යන්ත්‍ර සහ උපකරණ අළුත්වැඩියා සහ නඩත්තු කිරීම මෙම කාලය තුළ දී අඛණ්ඩව සිදු කරන ලදී. මගී මැදිරි 160 ක් මෙම වසර තුළ පුනරුත්තාපනය කර සේවය සඳහා යොදවා ඇත.

මගී මැදිරි 200ක් පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතියේ දිගුවක් ලෙස තවත් මගී මැදිරි 100ක් පුනරුත්ථාපන කටයුතු ආරම්භ කර ඇති අතර ඉන් දැනට මගී මැදිරි 62ක් 2023 12.31 වන විට අවසන් කර ඇත.

2023 වර්ෂයේ සේවය සඳහා යොදවා තිබූ දුම්රිය ඇණිය පිළිබඳව විස්තර පහත වගුවෙන් දක්වා ඇත.

දුම්රිය ඇණිය

වගු අංක 06

අංකය	වර්ගය	සංඛ්‍යාව
01	දුම්රිය එංජින් (ධාවනය සඳහා යොදවා ඇති)	57
02	බලවේග කට්ටල (ධාවනය සඳහා යොදවා ඇති)	101
03	මගී මැදිරි	1,642
04	ගැල්	1,983

මගී හා භාණ්ඩ ප්‍රවාහනය

2023 වර්ෂයේදී මගීන් මිලියන 109.15 ගමන් කල අතර එය 2022 වර්ෂයට සාපේක්ෂව 6 % ක වැඩිවීමක් පෙන්නුම් කරයි. මෙලෙස මගීන්ගේ වැඩිවීම සඳහා ප්‍රධාන ලෙසම බලපාන ලද්දේ දුම්රිය ප්‍රවේශපත්‍ර ගාස්තුවලට සාපේක්ෂව බස්රථ වල ප්‍රවේශපත්‍ර ගාස්තු වැඩිවීමයි.

ගමන්කළ මගී සංඛ්‍යාව හා මගී ආදායම

වගු අංක 07

වර්ෂය	ගමන්කළ මගීන් සංඛ්‍යාව (මිලියන)	මගී ආදායම රු. (මිලියන)	මගී කි. මී (මිලියන)
2022	102.73	9,174.91	6,602.24
2023	109.15	13,239.17	7,043.98

මෙම වසර තුළ නව දුම්රිය ගමන් වාරයන් 4ක් ආරම්භ කරන ලදී.

1. කොළඹ කොටුව සිට අවිස්සාවේල්ල දක්වා (අංක 9255 / 9655) - සීතාවක ඕඩීසී (සතියට ගමන්වාර 2 යි)
2. කොළඹ කොටුව සිට ත්‍රිකුණාමලය දක්වා (අංක 6077 / 6078) - (දිනකට ගමන්වාර 2 යි)

භාණ්ඩ ආදායම හා ප්‍රවාහනය කරන ලද භාණ්ඩ ප්‍රමාණය

වගු අංක 08

වර්ෂය	භාණ්ඩ ආදායම රු. (මිලියන)	භාණ්ඩ ප්‍රමාණය (ටොන් මිලියන)	ටොන් කිලෝමීටර් ප්‍රමාණය (මිලියන)
2022	915.66	1.75	138.68
2023	1,761.63	1.99	159.46

- 2023 වර්ෂයේ භාණ්ඩ ප්‍රවාහන කටයුතු පිළිබඳව සැලකීමේදී භාණ්ඩ ප්‍රවාහන ආදායම 92% ක් වැඩිවී ඇති අතර භාණ්ඩ ටොන් ප්‍රමාණය 13 % ක් වැඩිවී ඇත. ටොන් කිලෝමීටර් ප්‍රමාණය 15% ප්‍රමාණයකින්ද අඩුවීමක් පෙන්නුම් කරයි.

කාර්ය සාධන දර්ශක

වගු අංක 9

අංකය	කාර්ය සාධන දර්ශකය	2022	2023
01	ගමන් කළ මගී සංඛ්‍යාව (මිලියන)	102.73	109.15
02	මගී කි. මී. ප්‍රමාණය (මිලියන)	6,602.24	7,043.98
03	ප්‍රවාහනය කළ භාණ්ඩ ටොන් ප්‍රමාණය (මිලියන)	1.75	1.99
04	භාණ්ඩ ටොන් කි. මී. (මිලියන)	138.68	159.46
05	දුම්රිය කිලෝමීටර්	10,096,309.62	10,303,647.71

සමස්ථ දුම්රිය ධාවනය

දුම්රිය ගමන්වාර

වගු අංක 10

දුම්රිය සේවය	සැලසුම් කළ දුම්රිය සංඛ්‍යාව	ධාවනය වූ දුම්රිය සංඛ්‍යාව
තදාසන්න	65,670	61,729
ප්‍රාදේශීය	27,855	23,910
දුරස්ථ හා නගරාන්තර	19,495	19,332
රේල් බස්	730	677
i මගී	**113,759**	**105,648**
ii භාණ්ඩ	**8,687**	**6,247**
එකතුව	**122,426**	**111,895**

ඉහත වගු අංක 11හි දැක්වෙන තොරතුරු අනුව 2023 වසර තුළ ධාවනය සඳහා සැලසුම් කළ මගී දුම්රිය සංඛ්‍යාව **113,759** ක් වූ අතර එයින් **105,648** ක් ධාවනය කර ඇත. මගී දුම්රියන් ගෙන් 58% ක ප්‍රතිශතයක් තදාසන්න දුම්රියන් ලෙස සේවයට යොදවා ඇත.

ස්ථිර මාර්ග පද්ධතිය හා ගොඩනැගිලි

ස්ථිර මාර්ග පද්ධතියේ නඩත්තු කටයුතු හා වැඩිදියුණු කිරීම් අඛණ්ඩව ක්‍රියාත්මක කළ අතර ඒ සඳහා රේල් පිලි මීටර් 123, 353ක් ද කොන්ක්‍රීට් සිල්පර 27,674ක් ද දැව සිල්පර 45,023ක් ද බැලස්ට් කියුබ් 13,441ක් ද භාවිතා කෙරිණි.

දුම්රිය මාර්ග නඩත්තුව සඳහා උපයෝගි කර ගත් ද්‍රව්‍ය

වගු අංක 11

යොදා ගත් ද්‍රව්‍ය	ප්‍රමාණය
රේල් පිලි (මීටර්)	123, 353
දැව සිල්පර	45,023
වානේ සිල්පර	613
කොන්ක්‍රීට් සිල්පර	27,674
බැලස්ට් කියුබ්	13,441

සංඥා හා විදුලි සංදේශ පද්ධතිය

සංඥා පද්ධතියේ අඛණ්ඩව නඩත්තු කටයුතු සහ වැඩිදියුණු කිරීම කාර්යක්ෂම දුම්රිය සේවයක් ලබා දීම කෙරෙහි බලපාන වැදගත් සාධකයක් වේ. 2023 වසරේ ද සංඥා පද්ධතියේ වැඩිදියුණු කිරීම් හා නඩත්තු කටයුතු අඛණ්ඩව ක්‍රියාත්මක කරමින් පහත සඳහන් කාර්යන් ක්‍රියාත්මක කරනු ලැබේ.

1. ගනේවත්ත නව සංඥා පද්ධතිය සහ වැල්ලව හා ගනේවත්ත දුම්රිය ස්ථාන අතර ස්වයංක්‍රීය බ්ලොක් සංඥා පද්ධතිය ක්‍රියාත්මක කිරීම.
2. මරදාන දුම්රිය ස්ථානයේ 4 වන මාර්ගයේ සම්බන්ධතාවය සැකසීම
3. බූඔය නව දුම්රිය ස්ථානයේ සංඥා පද්ධතිය සකස් කිරීම.
4. FOT-WTE Up Line Dn Direction ස්වයංක්‍රීය බ්ලොක් සංඥා පද්ධති ස්ථාපනය.
5. මරදාන නුගේගොඩ අතර රේඛා ස්වයංක්‍රීය බ්ලොක් සංඥා පද්ධතිය ස්ථාපිත කිරීම.
6. නුවර පේරාදෙණිය අතර ද්විත්ව මාර්ගයේ සංඥා පද්ධතිය ස්ථාපිත කිරීම.

ශ්‍රී ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනය

ගුණාත්මක කාර්මික ශිල්පීන් බිහි කිරීමේ අරමුණෙන් පවත්වාගෙන යනු ලබන ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනය සිය කාර්යභාරය 2023 වර්ෂයේදී ද අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදි. පුහුණුව ලබන සිසුන්ගේ ප්‍රායෝගික පරීක්ෂණ පැවැත්වීම සඳහා යටිතල පහසුකම් සැපයීම, වෘත්තීය පරීක්ෂණ සඳහා පහසුකම් සැලසීම, ඉංජිනේරු තාක්ෂණ ආයතනයේ පුහුණු වන ආධුනිකයන්ගේ ඇගයීම් කටයුතු සිදු කිරීම, විශ්ව විද්‍යාල සිසුන්ගේ වැඩ බිම් පුහුණු අධීක්ෂණ කටයුතු සිදු කිරීම ආදී කාර්යයන් මෙමඟින් සිදු කොට ඇත.

මෙම ආයතනය මඟින් කරගෙන යනු ලබන පාඨමාලා ප්‍රධාන වශයෙන් පහත ආකාරයෙන් ක්‍රියාත්මක කරන ලදි. ජාතික වෘත්තීය සුදුසුකම් National Vocational Qualification තත්වයන් ඇතුළත් පූර්ණකාලීන පාඨමාලා මේ යටතේ පවත්වාගෙන යනු ලබයි.

2023 වසර තුළ බාහිර ආයතන සඳහා ජර්මන් කර්මන්ත ගත පුහුණුව පිළිබඳ තොරතුරු පහත වගුවෙන් දැක්වේ.

2023 වසරේ කර්මාන්තගත පුහුණුව ලබාදීම

වගු අංක 12

#	ආයතනය	සිසුන් ගනන
1	HNDE	02
2	වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය	01
3	කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය	04
4	ඉංජිනේරු තාක්ෂණ ආයතනය	16
5	කාර්මික විද්‍යාලය	01
6	BET උපාධි අපේක්ෂකයින්	11
7	ඉංජිනේරු උපාධි අපේක්ෂකයින්	26
8	මොරටුව විශ්වවිද්‍යාලයේ තාක්ෂණික අංශය	01
9	කොතලාවල ආරක්ෂක විද්‍යාලය	04
10	කර්මාන්ත ඉංජිනේරු පුහුණු ආයතනය	06
11	වෘත්තීය පුහුණු අධිකාරිය	02
12	Skill Collage of Technology	01
13	නාවික හමුදා නිලධාරීන්	09
	එකතුව	**84**

දුම්රිය ආරක්ෂක සේවය

2023 වසරෙහි දුම්රිය ආරක්ෂක සේවය විසින් අත්පත්කර ගත් ප්‍රගතිය පහත වගු අංක 14 මඟින් දැක්වේ.

අංක 13

ක්‍රියාත්මක කළ කාර්යය	2023	
	ප්‍රමාණය	දඩමුදල (රු)
ප්‍ර.නොමැතිව	121	390,520.00
ඉහළ පංතිය ගමන් කිරීම	91	296,100.00
දුම්රියේ හරස්මාර්ග නඩු	2	140,171.00
උසාවි දඩ	110	162,000.00
අධි බර	2	532.00
අනවසර වෙළඳුන්	8	අධිකරණයට ඉදිරිපත් කර ඇත.
යාවකයින්	-	-
හිග බදු	-	-

අභියෝග හා ගැටලු

1. පවතින එන්ජින් වලින් 72% ක ප්‍රතිශතයක් වසර 40 කට වඩා පැරණි එන්ජින් වීම
2. විශාල මාර්ග කලාපයක් ආවරණය කරනු ලබන්නේ පැරණි සංඥා පද්ධතියකින් වන අතර ඒ හේතුවෙන් සංඥා ගැටළු වැඩි වැඩියෙන් පැන නැගීම
3. කාර්ය බහුල වේලාවන් වලදී පවතින මාර්ග පද්ධතිය ප්‍රමාණවත් නොවීම.
4. පුහුණු ශ්‍රමිකයන්ගේ පවතින ගැටළු.
5. මගී හා භාණ්ඩ ප්‍රවාහනයට අවශ්‍ය යටිතල පහසුකම්හි පවතින අඩු ධාරිතාව.
6. සමස්ත දුම්රිය මාර්ග ජාලයේ පවතින අනාරක්ෂිත දුම්රිය හරස් මාර්ග සංඛ්‍යාව ඉහළ අගයක් ගැනීම.
7. ප්‍රවේශ පත්‍ර නොමැතිව ගමන් කිරීම පාලනය කිරීමේ ගැටළු.
8. එංජින් සංචිතයේ ගැටළු.
9. තාක්ෂණික අංශ වල පැවති අධික පුරප්පාඩු.
   දෛනික සේවා පවත්වා ගෙන යෑමේදී සියලුම අංශවල පවතින කාර්ය මණ්ඩල හිඟය නිසා අදාල කටයුතුවලදී ගැටළුකාරී තත්ත්වයන්ට මුහුණ දීමට සිදු වේ.
10. පුනරාවර්ථන වියදම්, විශේෂයෙන් අමතර කොටස් මිල ඉහළ යාම.
11. ප්‍රසම්පාදන කටයුතු සඳහා දිගු කාලයක් ගතවීම.

දුම්රිය සේවාවේ ගුණාත්මක හා විශ්වසනීයත්වය ඉහළ නැංවීම සඳහා 2023 වසරේ ක්‍රියාත්මක කළ හා ඉදිරියට ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත කාර්යයන්

- ඉන්දියාවෙන් හා චීනයෙන් ආනයනය කරන ලද නව දුම්රිය මගී ප්‍රවාහන කටයුතු හා භාණ්ඩ ප්‍රවාහන කටයුතු සඳහා යොදා ගැනීම.
- දේශීය වශයෙන් මගී මැදිරි පුනරුත්ථාපනය කිරීම.
- වායු සමීකරණය කරන ලද බලවේග කට්ටල 02 ක් ප්‍රසම්පාදනය කිරීම
- මහව සිට ඕමන්තේ දක්වා දුම්රිය මාර්ගය පුනරුත්ථාපනය කිරීම අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම.
- කැලණිවැලි දුම්රිය මාර්ගය වැඩිදියුණු කිරීම ක්‍රියාත්මක කිරීම.
- මගී මැදිරි 200 ක් පුනරුත්ථාපනය කිරීම අවසන් කර එම ව්‍යාපෘතියේම දිගුවක් ලෙස තව මැදිරි 100 ක් පුනරුත්ථාපනය කිරීමේ කටයුතු ආරම්භ කිරීම.
- ලෝක බැංකුව මගින් තෝරාගත් දුම්රිය ස්ථාන 14ක සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම.
  (මුදල් අමාත්‍යාංශය - 10 , සංචාරක මණ්ඩලය - 04)
- එම ව්‍යාපෘතිය යටතේ මගී මැදිරි 80 ක සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීම.
- ආසියානු සංවර්ධන බැංකුවේ මූල්‍ය දායකත්වය යටතේ ක්‍රියාත්මක කරනු ලබන කොළඹ තදාසන්න දුම්රිය සේවය සංවර්ධනය කිරීමේ කටයුතු අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම.
  කොළඹ තදාසන්න දුම්රිය සේවාව වඩා කාර්යක්ෂම හා මගී ආකර්ෂණය සහිත සේවාවක් බවට පත් කිරීමේ අරමුණෙන් ප්‍රධාන, කැලණිවැලි, මුහුදුබඩ හා පුත්තලම දුම්රිය මාර්ග ආවරණය වන පරිදි දුම්රිය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම මෙම ව්‍යාපෘතියේ විශේෂ අරමුණ වේ. තදාසන්න ප්‍රදේශයේ මාර්ග පද්ධතිය වැඩි දියුණු කිරීම සංඥා හා විදුලි සංදේශ පද්ධතිය වැඩි දියුණු කිරීම, දුම්රිය ස්ථාන සංවර්ධනය කිරීම ආදී ව්‍යාපෘති කිහිපයක් මෙම ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක වේ.
  තවද පහත සඳහන් කාර්යයන් වල මූලික කටයුතු සිදුකර ඇත.

- පොල්ගහවෙල සිට කුරුණෑගල දක්වා ද්විත්ව දුම්රිය මාර්ගය ඉදිකිරීම
- කුරුණෑගල සිට මහව දක්වා ද්විත්ව දුම්රිය මාර්ගය ඉදිකිරීම
- දකුණු පයාගල සිට අලුත්ගම දක්වා ද්විත්ව දුම්රිය මාර්ගය ඉදිකිරීම
- ඉන්දියානු ණය ආධාර යටතේ රත්මලාන හා දෙමටගොඩ ධාවනාගාරයක් හා අංගනයක් ඉදිකිරීම.
- මහව සිට අනුරාධපුරය දක්වා සංඥා පද්ධතිය ස්ථාපිත කිරීම.
- බලවේග කට්ටල පුනරුත්ථාපන හා නඩත්තු කටයුතු සඳහා රත්මලානේ කර්මාන්ත ශාලාවක් ස්ථාපිත කිරීම .
- මිහින්තලය දුම්රිය ස්ථානය ආසන්නයේ භාණ්ඩ ප්‍රවාහන පර්යන්තයක් ස්ථාපිත කිරීම.

ඉදිරි දැක්ම

වර්තමාන රජයේ ප්‍රවාහන ප්‍රතිපත්තියේ මුඛ්‍ය පරමාර්ථය වන්නේ මාර්ග තදබදය සඳහා විසඳුම් ලබාදීම සඳහා වඩාත් ප්‍රශස්ථ ප්‍රවාහන මාධ්‍යයක් වෙත යොමු වීමයි. ඒ අනුව මහා මාර්ගයේ ගමන් ගන්නා මගීන් හා භාණ්ඩ ප්‍රවාහන කටයුතු හැකි තරම් දුම්රිය මගින් සිදු කිරීම ප්‍රධාන අභිලාශයක් වේ. රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුව දුම්රිය යටිතල පහසුකම් සංවර්ධනයේදී ප්‍රමුඛතා හඳුනාගෙන ඒවා ක්‍රියාත්මක කිරීම මඟින් මගීන් සඳහා ඉතා කාර්යක්ෂම හා සකසුරුවම් දුම්රිය සේවාවක් ලබාදීම දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණ වේ. ඒ අනුව දුම්රිය ඉදිරි සැලසුම් මෙම පරමාර්ථ මුල් කර ගනිමින් සිදු කිරීමට අපේක්ෂා කෙරේ. මේ යටතේ වඩාත් ආකර්ෂණීය හා පරිසර හිතකාමී ප්‍රවාහන මාධ්‍යයක් ලෙස දුම්රිය සේවයේ පහත සඳහන් සාධනීය සංවර්ධනයන් සිදු කිරීමට අපේක්ෂා කෙරේ.

- කාර්යක්ෂම හා සුවපහසු දුම්රිය සේවාවක් පවත්වාගෙන යාම.
- පානදුර - කොළඹ - වේයන්ගොඩ, රාගම - කටුනායක - මිගමුව සහ මරදාන - හෝමාගම යන දුම්රිය සේවා සඳහා විදුලි දුම්රිය පද්ධතියක් හඳුන්වා දීම හා සාමාන්‍ය දුම්රිය සේවා වලට අමතරව සුඛෝපභෝගී කාර්යාලීය දුම්රිය සේවාවක් ආරම්භ කිරීම.
- දුම්රිය සේවාව නවීකරණය සඳහා නූතන තාක්ෂණික ක්‍රමවේද සහ ඩිජිටල්කරණය හඳුන්වා දෙමින් දුම්රිය ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීම සහ ආසන වෙන් කිරීම මාර්ගගත ක්‍රමවේදය (Online) ඔස්සේ සිදු කිරීමට කටයුතු කිරීම.
- භාණ්ඩ ප්‍රවාහනය සඳහා අවශ්‍ය දුම්රිය එංජින් ආනයනය කිරීම සහ දුම්රිය තට්ටු දේශීයව ඉදිකිරීම හා කොළඹ, හම්බන්තොට, ත්‍රිකුණාමලය, කන්කසන්තුරය යන වරාය වල දුම්රිය මගින් භාණ්ඩ ප්‍රවාහනය කිරීම සඳහා අවශ්‍ය පහසුකම් වර්ධනය කිරීම

ඉදිරි සංවර්ධන ව්‍යාපෘති

01. මහව - ඕමන්ත දුම්රිය මාර්ගය පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය
02. කුරුණෑගල සිට මහව දක්වා ද්විත්ව දුම්රිය මාර්ගය ඉදිකිරීම.
03. පුත්තලම දුම්රිය මාර්ගයේ මීගමුව සිට කොච්චිකඩේ දක්වා ද්විත්ව දුම්රිය මාර්ගය ඉදිකිරීම
04. පැරණි කැලණි පාලම නැවත ඉදිකිරීම.
05. ඉලෙක්ට්‍රොනික ප්‍රවේශපත්‍ර ක්‍රමයක් හඳුන්වාදීම.
06. මගී මැදිරි දේශීයව නිෂ්පාදනය ආරම්භ කිරීම.
07. මහව සිට අනුරාධපුරය දක්වා නව දුම්රිය සංඥා පද්ධතියක් ස්ථාපිත කිරීම.
08. මධ්‍යගතව අධික්ෂණය කළ හැකි ආරක්ෂිත දුම්රිය හරස්මාර්ග පද්ධතියක් ස්ථාපිත කිරීම.
09. මගී මැදිරි 200 ක් පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතියේ දිගුවක් ලෙස තවත් මැදිරි 100 ක් පුනරුත්ථාපනය කිරීම.
10. දකුණු පයාගල - අළුත්ගම දක්වා දුම්රිය මාර්ගය ද්විත්වකරණය කිරීම.

03 පරිච්ඡේදය

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්ය සාධනය **ඒසීඒ - එෆ්**

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාල සීමාව සඳහා වන මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

අය වැය (අයවැය 2023)		සටහන	තත්‍ය		
			වර්තමාන වර්ෂය 2023(රු.)	ඉකුත් වර්ෂය 2022(රු.)	
-	**ආදායම් ලැබීම**				
-	ආදායම් බදු	1			
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2			ඒසීඒ-1
-	අන්තර්ජාතික වෙළඳාම මත බදු	3			
14,500,000,000	බදු නොවන ආදායම් හා වෙනත්	4	16,079,474,196	10,335,603,441	
14,500,000,000	**මුළු ආදායම් ලැබීම් (අ)**		**16,079,474,196**	**10,335,603,441**	
	ආදායම් නොවන ලැබීම්				
12,976,907,000	භාණ්ඩාගාර අග්‍රිම		9,143,536,000	8,725,166,000	ඒසීඒ-4
-	තැන්පතු		1,808,648,336	1,462,574,820	ඒසීඒ-3
3,000,000,000	අත්තිකාරම් ගිණුම්		2,732,243,319	1,636,685,649	ඒසීඒ-5/5(ඒ)
-	වෙනත් ලැබීම්			740,148,051	
15,976,907,000	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		**13,684,427,655**	**12,564,574,520**	
30,476,907,000	මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		**29,763,901,851**	**22,900,177,961**	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ(ඇ)		**300,002,531**	**126,785**	
30,476,907,000	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම නොවන		**29,463,899,321**	**22,900,051,176**	

අය වැය (අයවැය 2023)		සටහන	තත්‍ය		
			වර්තමාන වර්ෂය 2023(රු.)	ඉකුත් වර්ෂය 2022(රු.)	
	අඩුකළා :- වියදම්				
	පුනරාවර්තන වියදම්				
11,788,100,000	වේතන, වැටුප් සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	**5**	11,337,309,555	11,082,993,345	
9,732,200,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	**6**	16,473,122,111	12,398,940,614	
36,000,000	සහනාධාර, සහනාධාර ප්‍රදාන සහ මාරුකිරීම්	**7**	31,621,285	30,686,137	ඒසිඒ-2(ii)
	පොළී ගෙවීම්	**8**			
	වෙනත් පුනරාවර්තන වියදම්	**9**			
	මුළු පුනරාවර්තන වියදම් (ඈ)				
21,556,300,000	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**27,842,052,951**	**23,512,620,096**	
	මූලධන වියදම්				
7,171,800,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	**10**	6,571,896,237	3,534,188,812	
15,016,300,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	**11**	5,320,929,724	15,285,208,816	
200,000	ප්‍රාග්ධන මාරුකිරීම්	**12**	141,556	671,078	ඒසිඒ-2(ii)
	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	**13**			
5,000,000	හැකියා වර්ධනය	**14**			
8,093,700,000	වෙනත් මූලධන වියදම්	**15**	4,848,817	481,120	
30,287,000,000	**මුළු මූලධන වියදම් (උ)**		**11,897,838,178**	**19,018,811,151**	
-	**ප්‍රධාන ලෙජර් වියදම් (උෆ)**				ඒසිඒ-4
